දිවුලපිටිය ප්‍රාදේශීය සභාව
ගම්පහ දිස්ත්‍රික්කය
-------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජූනි 14 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 සැප්තැම්බර් 16 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට දිවුලපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | --------------------- | ----------- | --------------------------- |
| (i) | සභාවට පරිත්‍යාග වශයෙන් ලැබී තිබුණු රු.50,795,074 ක් වූ ස්ථාවර වත්කම් පරිත්‍යාග ගිණුමට බැර කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළයුතු වේ. | ජර්නල් සටහන් මගින් නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| (ii) | සභාවට අයිති ඉඩම් 9 කට අදාල වටිනාකම තක්සේරුකර ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කළයුතු වේ. | 2019 වර්ෂය සඳහා ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (iii) | ගිණුම් විෂයයන් 08 ක ශේෂයන් හා උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.5,239,443 ක වෙනසක් පැවතුණි. | අදාල ශේෂ වෙනස්කම් සඳහා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළයුතු වේ. | ගිණුම් විෂයන් 8 හි වටිනාකම රු.7,979,676, 2015 වර්ෂයට පෙර සිට ලේඛන ගත වන ශේෂයන් වන අතර නිරවුල් කරගැනීමට කටයුතු කරමි. |

1.4 **අනුකූල නොවීම**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| ---------------------- | ---------------- | -------------- | -------------------- |
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>(අ ) 371 | වර්ෂ 03 ට වැඩි රු. 6,583,258 ක අග්‍රිම ශේෂය පියවා නොතිබුණි. | අග්‍රිමයන් පියවීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ආ) 571 | පොදු තැන්පත් ගිණුමේ පැවති අවු.02 ට වැඩි රු.6,117,897 ක ශේෂය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතු වේ. | පිළිගතිමි. මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.40,618,153 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.30,618,984 ක් විය.

2.2 **මූල්‍ය පාලනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.121,102 ක් වූ අගරු චෙක්පත් ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි අනුව අගරු චෙක්පත් ගිණුම පූර්ව තත්ත්වයට පත්කළයුතු වේ. | පිළිගතිමි. මෙය ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |

2.3 **ආදායම් පරිපාලනය**

2.3.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත පරිදි විය.

| | 2018 වර්ෂය | | | | 2017 වර්ෂය | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම හා බදු | 10,150,985 | 10,521,241 | 10,439,903 | 81,338 | 11,812,000 | 13,070,057 | 12,726,268 | 343,789 |
| කුලී | 6,676,303 | 6,967,641 | 6,954,734 | 12,906 | 5,694,000 | 6,023,013 | 5,918,300 | 104,713 |
| බලපත්‍ර ගාස්තු | 1,564,544 | 1,925,064 | 1,925,064 | - | 1,100,000 | 1,949,108 | 1,949,108 | - |
| වෙනත් ආදායම් | 58,813,707 | 65,529,022 | 65,529,022 | - | 45,879,000 | 52,892,443 | 52,892,443 | - |

2.3.2 **ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ බිල්කල රු.84,942,968 ආදායමෙන් සියයට 99 ක් පමණ වර්ෂය තුල රැස් කරගෙන තිබූ නමුත් පෙර වර්ෂයන්හි රු.4,489,370 ක හිඟ ආදායම් අයකර ගැනීමේ ප්‍රගතිය සියයට 25 ක් වැනි අවම මට්ටමක පැවතුණි. | හිඟ වරිපනම් අයකිරීමේ කටයුතු කාර්යක්ෂම කළයුතු වේ. | නෛතිකව අය කර ගත නොහැකි හිඟ ශේෂ රු. 2,803,557 ක් ලේඛනවලින් ඉවත් කිරීම සඳහා, පලාත් පාලන විෂයභාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව තවදුරටත් ඉතිරි හිඟ ආදායම් අය කර ගැනීමට ආදායම් පරීක්ෂකවරු කටයුතු කරනු ලබන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ආ) දිවුලපිටිය උප කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට ආදායම් හිඟ ශේෂය රු.1,264,260 න් වර්ෂ 10 ට වැඩි හිඟ ශේෂය රු.1,138,800 කි. එනම් සියයට 90 ක් විය. | හිඟ ආදායම් ශේෂ අයකර ගැනීම කාර්යක්ෂම කළයුතු වේ. | දිවුලපිටිය උප කාර්යාලයේ 2018 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

2.3.3 **<u>වරිපනම් හා බදු</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට පැවති රු.253,010 ක වරිපනම් හිඟ ශේෂය තුළ අවුරුදු 5-10 අතර රු.54,887 ක් සහ අවුරුදු 10 ට වැඩි රු.90,651 ක හිඟ ශේෂ තිබුණි. | හිඟ ආදායම් ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | වරිපනම් හිඟ ආදායම් අය කර ගැනිමට කටයුතු කරගෙන යන බව දන්වමි. |

2.3.4 **<u>කුලී</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පෙර වර්ෂවල කඩකුලී හිඟයෙන් රු.2,719,302 ක මුදලක් එනම් සියයට 98 ක් සමාලෝචිත වර්ෂය වන විටත් අය කරගෙන නොතිබුණි. | හිඟ කුලී අයකර ගැනීමට හෝ කපාහැරීමට කටයුතු කළ යුතු වේ. | පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමාගේ 2019 මැයි 11 දිනැති ලිපියෙන් බදු කර කුලී රු.2,392,606 කපා හැරීමට අනුමැතිය ලැබී ඇත. |

2.4 **<u>අධිභාර</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නියමිත පරිදි නොගෙවීම නිසා සභාව විසින් රු.163,876 ක අධිභාරයක් ගෙවා තිබුණි. | අදාල මුදල අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | 2018 ජුනි 6 දිනට අදාලව වවුචර් අංක 976 යටතේ 468526 චෙක්පත මගින් රු.163,876 ක් අධිභාර මුදල් වශයෙන් ගෙවූ අතර රු.5,092 ක් අයකරගෙන තිබේ. 2018 දෙසැම්බර් 31 දිනට තවදුරටත් රු.158,785 ක් අයකරගත යුතු වේ. |

3. **<u>මෙහෙයුම් සමාලෝචනය</u>**

3.1 **<u>කාර්ය සාධනය</u>**

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබුන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) **<u>අතුරු ව්‍යවස්ථා</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2018 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 09 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. එසේම පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් 09 ක් වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙලකර නොතිබුණි. | අවශ්‍ය අතුරු ව්‍යවස්ථා පනවා ගතයුතු වේ. | පිළිගනිමි. අතුරු ව්‍යවස්ථා සියල්ලම වෙනුවෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර ඇත. |

(ආ) **<u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටු කලයුතු ව්‍යාපෘති 12 ක් ඉටුකර නොතිබුණි. | ව්‍යාපෘති ඉටුකර ගතයුතු වේ. | ක්‍රියාත්මක නොකරන ලද ව්‍යාපෘති වෙනුවට ව්‍යාපෘති 18 ක් ක්‍රියාත්මක කිරීමට 2018 දෙසැම්බර් 11 වැනි දින මහා සභා රැස්වීමේදී තීරණය වී ඇත. |

(ඇ) **<u>අත්හැර දැමූ කර්තව්‍යයන්</u>**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2013 වර්ෂයේ රු.499,657 ක් වැයකර ජාතික කාර්මික පර්යේෂණ සංවර්ධන ආයතනයේ (නර්ඩ්) උපදේශකත්වයෙන් ජීව වායු ඒකකයක් සකස්කර , එය ක්‍රියාත්මක කිරීම සඳහා සභාවේ සේවකයෙකුට රු.6,000 ක ගාස්තු ගෙවා නර්ඩ් ආයතනය මගින් පුහුණුකර තිබූ නමුත් 2019 මැයි 21 දින වන විටත් අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොගෙන අත්හැර දමා තිබුණි. | නර්ඩ් ආයතනයේ උපදෙස් අනුව ජීව වායු ඒකකය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළයුතු වේ. | ඉදිරියේදී නර්ඩ් ආයතනයේ උපදෙස් ලබා ගෙන ජීව වායු ඒකකය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලද බව දන්වා සිටිමි. |

(ඈ) **සන අපද්‍රව්‍ය කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.63,836,580 ක් වියදම් දරා තිබුණ අතර ඉන් රු.62,807,866 ක මුදලක් සේවක මණ්ඩලය සඳහා වැය කර තිබුණි. එය සභාවේ මුළු සේවක වැටුපෙන් එනම් සියයට 61 කි. | කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සහ අලෙවිය වැඩිකර ගැනීමටත් වියදම් අඩුකර ගැනීමටත් කටයුතු කළයුතු වේ. | කොම්පෝස්ට් අලවිය සඳහා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම තුලින් පොහොර අලෙවි ආදායම වැඩි කර ගැනීම සඳහා වැඩකටයුතු කරනු ලැබේ. නාවාන කොම්පෝස්ට් අංගනය තුළ නොදිරන ඉටි කොළ හා ප්ලාස්ටික් වර්ග බේල් කර හොල්සිම් ආයතනයට යවනු ලැබේ. |

(ඉ) **පාරිසරික ගැටළු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (i) | සභාව විසින් කසළ බැහැර කිරීම සඳහා යොදාගෙන ඇති භූමියට පරිසර බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. | පරිසර බලපත්‍ර ලබා ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ii) | පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු වෙළඳ ස්ථාන 106 ක් සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමකින් තොරව වෙළඳ බලපත්‍ර ලබාදී තිබුණි. | පරිසර ආරක්ෂණ බලපත්‍ර සහ වෙළඳ බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයන් විධිමත් කළයුතු වේ. | එම ව්‍යාපාර ස්ථානවලින් කොටසක් පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලියකට ඇතුලත් වී සිටින බව වාර්තා කරන අතර අනෙකුත් ව්‍යාපාර හිමිකරුවන් දැනුවත් කර පාරිසරික ආරක්ෂණ බලපත්‍ර ලබා ගැනීමේ ක්‍රියාවලියකට යොමු කරලීමට කටයුතු කරනු ලබන බව දන්වා සිටිමි. |

(ඊ) **මහජන පැමිණිලි**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ මහජන පැමිණිලි 174 කින් පැමිණිලි 118 ක් විසඳා නොතිබුණි. ඒ අනුව මහජන පැමිණිලි විසඳීමේ ප්‍රගතිය සියයට 32 ක පමණ අවම මට්ටමක පැවතුණි. | නොවිසඳී ඇති මහජන පැමිණිලි විසඳීමට කටයුතු කළයුතු වේ. | මහජන පැමිණිලි පරීක්ෂාකර බලා විසඳීමට ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව දන්වා සිටිමි. |

(උ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍රය අනුව 2019 – 2023 දක්වා තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්ම සකස් කර තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය සඳහා තිරසර සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගතයුතු වේ. | තිරසර සංවර්ධන ඉලක්ක සම්බන්ධයෙන් වූ 2030 න්‍යායපත්‍ර අනුව 2019 – 2023 දක්වා තිරසර සංවර්ධන සංයුක්ත සැලැස්ම සකස් කර ඇත. |

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පුස්තකාලාධිපති තනතුරු 04 ක් ද, ආදායම් පරීක්ෂක තනතුරු 03 ක්ද, වැඩ ක්ෂේත්‍ර පරිපාලක තනතුරු 01 ක් ද, කම්කරු තනතුරු 16 ක් ද, ඇතුළුව තනතුරු 24 ක පුරප්පාඩු 2018 දෙසැම්බර් 31 දින වන විටත් පැවතුණි. | පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළයුතු වේ. | පුරප්පාඩු පිරවීම සඳහා කටයුතු සිදුකරමින් පවතී. |
| (ආ) | 2014 දෙසැම්බර් 19 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 25/2014 පරිදි ප්‍රාථමික ශ්‍රේණියේ කම්කරු සේවකයන් 14 දෙනෙකුට ස්ථිර පත්වීම් ලබාදී තිබුණද උක්ත චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තාකර අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් කරගෙන නොතිබුණි. | බඳවා ගැනීමේ ක්‍රමවේද විධිමත් කළයුතු වේ. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමැතිය ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. |
| (ඇ) | වසර 02 සිට වසර 20 දක්වා කාලයක සිට අය නොවී පවතින සේවක ණය ශේෂය තුල මියගිය හා සේවය අතහැර ගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.139,944 ක ශේෂයක් හා ස්ථානමාරුවී ගිය නිලධාරීන් 03 දෙනෙකුගෙන් රු.38,169 ක ශේෂයක් ද අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිතුරු ලබාදී නොමැත. |

3.3 <u>වත්කම් කළමනාකරණය</u>

3.3.1 <u>පවරා නොගත් වත්කම්</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය මගින් ලද වාහන 02 ක් ද පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබුණු වාහන 04 ක් හා බස්නාහිර පළාත් ලේකම්ගෙන් එක් වාහනයක් ඇතුළුව රු.44,044,173 ක් වටිනා වාහන 07 ක් 2019 මැයි 21 දින වන විටත් පවරාගෙන නොතිබුණි. | වාහන පවරා ගැනීමට කටයුතු කළයුතු වේ. | එම වාහන සභාවට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු මෙම වර්ෂය තුළදී ඉටු කරන බව දන්වා සිටිමි. |

3.3.2 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ප්‍රාදේශීය සභාව සතු රු.1,500,000 ක් වටිනා ට්‍රැක්ටර් රථ 05 ක්, දිරාපත් ටේලර් 03 ක් හා දිරාපත් ජල බවුසරයක් නිෂ්ක්‍රීයව පැවතුණි. 2019 මැයි 21 දින වන විටත් මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | නිෂ්ක්‍රිය වාහන විධිමත්ව ඉවත් කළයුතු වේ. | ධාවන තත්ත්වයේ පවතින ට්‍රැක්ටර් රථ 03 ක් හැර ඉතිරි වාහන ඉවත් කිරීමට කටයුතු කරමින් පවතී. |

3.3.3 **හඳුනාගත් පාඩු**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම අනුව පොදු ගබඩා තොගයෙහි රු.22,021,294 ක හා විදුලි ගබඩා තොගයෙහි රු.913,921 ක හඳුනා නොගත් තොග ඌනතාවයක් පැවතුණි. | ඌනතාවය හඳුනාගෙන ඊට වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | හඳුනා නොගත් තොග ඌනතාවය සොයා බලා ඉදිරියේදී කටයුතු කරන බව දන්වා සිටිමි. |
| (ආ) | 2002, 2003, 2006 හා 2007 වර්ෂවලට අදාල රු.1,458,023 ක් වූ එකතුකල අගය මත බදු මුදල් ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් රු.290,726 ක දඩ මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. | අදාල නිලධාරීන්ගෙන් දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |